## ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

## මාතලේ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 03 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2010 මැයි 06 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය
------

මෙම වාර්තාවේ ඇතුළත් අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1:3. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1:3:1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-----------------------

පොදු ගබඩා භාණ්ඩ සම්බන්ධයෙන් ගිණුම් තැබීමේ දී ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කිරීමෙන් තොරව මිළදී ගනු ලබන භාණ්ඩ/ද්‍රව්‍ය සෘජුවම වැය ශීර්ෂයට හර කර ගෙවා තිබුණි.

1:3:2 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2009 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලයට අදාළව රු.100,000 ක දුරකථන බිල් පත් සඳහා එම වර්ෂය වෙනුවෙන් වූ ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා 2010 වර්ෂයේ 105(2) වැය විෂයයට හර කර ගෙවා තිබුණි. මේ නිසා වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කරදමුල්ල ප්‍රජාශාලාව ඉදිකිරීම සඳහා වැය කර තිබූ රු.45,389 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) සි.පි.ආර්.බී.-2996 ට්‍රැක්ටරය සඳහා ඉකුත් වර්ෂයට අදාළ රු.61,397 ක් වූ හිඟහිටි ණය වාරික වෙනුවෙන් ණය හිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ 105(3) ශීර්ෂයට හර කර ගෙවා තිබුණි. මේ නිසා වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාළ රු.2,587 ක් වූ චෙක්පොත් ගාස්තුව 2010 වර්ෂයේ 105(3) වැය විෂයයට හර කර ගෙවා තිබූ නිසා වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාළ මුද්දර බදු රු.6,882 ක් 2010 වර්ෂයේ 105(3) වැය විෂයයට හර කර ගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයට අදාළ සතිපොල ශුද්ධ පවිත්‍ර කිරීමේ ගාස්තු රු.6,000 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) 2008 වර්ෂයේ විගණන ගාස්තු රු.87,517 ක් සමාලෝචිත වර්ෂයේ 105(3) වැය විෂයයට හර කර ගෙවීම නිසා වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) 2002 ජනවාරි 19 දින අංක 776 දරන පිඹුරේ කැබලි අංක 03 ට අයත් රු.25,000 ක් වටිනාකමැති පර්චස් 31 ක ඉඩම පරිත්‍යාගශීලියකු විසින් සභාවට පවරා දී තිබුණත් එම වත්කම් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(එ) පොදු සැපයුම් ණයහිමියෝ යටතේ ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස 2010 ජනවාරි 01 ඉදිරියට ගෙන ආ ශේෂය ලෙස රු.86,600 ක් දක්වා ඇත. සභාව විසින් 1994 සිට 2003 දක්වා කාලයට අදාළව රු.192,257 ක් ද 2008 සිට 2010 දක්වා කාලයට රු.259,800 ක් ද වශයෙන් එකතුව 452,057 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු පවතින නමුත් එම වටිනාකම් ගිණුම් වලින් හෙළිදරව් කර නොතිබුණි.

(ඒ) හිඟ ජල ගාස්තු රු.227,784 ක ශේෂයක් පැවතුනද ශේෂ පත්‍රයේ ණයගැතියන් යටතේ එම වටිනාකම දක්වා නොතිබුණි.

1:3:3 නොසැසදු පාලන ගිණුම්

--------------------------

ගිණුම් විෂයයන් 05 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු12,733,661 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු16,438,266 ක් විය.

1:3:4 අවිනිශ්චිත ගිණුම

------------------

2010 ජනවාරි 01 දනට අවිනිශ්චිත ස්වභාවයේ ගිණුම්වල බැර ශේෂය රු.2,021,717 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුලදී රු.1,319,342 ක් ගිණුමට එකතු වී තිබුණෙන සමාලෝචිත වර්ෂය අවසානයට වූ ගිණුම් බැර ශේෂය රු.3,339,060 ක් විය.

1:3.5 ගෙවිය යුතු ගිණුම්

-------------------

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.6,584,697 ක් විය.

1:3:6 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

----------------------------------

2011 අගෝස්තු 08 දින වන විට විගණන විමසුම් 02 කට පිළිතුරු සපයා නොතිබූ අතර, එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු.184,190 ක් විය.

(ආ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

--------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.10,315,965 ක් වූ ගණුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඇ) ලෙඛන පැවත්වීම

-------------------

පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණි.

(i) පොදු ජේරය

(ii) ණයහිමි ලෙඛනය

(iii) ණය ගැතිලේඛනය

1:3:7 අනුකූල නොවීම්
-----------------

පහත දැක්වෙන නිති,රීතී රෙගුලාසි වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| <u>1988 ප්‍රාදේශය සභා(මුල්‍ය හා පරිපාලන)රීතී මාලාව</u> | |
| (i) 214 රීතිය හා මුදල් රෙගුලාසි 756,203 | 2009 හා 2010 වර්ෂ වෙනුවෙන් වූ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2011 අගෝස්තු 04 දින වන විටත් සිදුකර නොතිබුණි. |
| (ii) 168 රීතිය | කිසියම් වර්ෂයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඊට පසු වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2011 ජුනි 03 දින දීය. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-----------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.356,480 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,419,931 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i)වරිපනම් හා බදු | 220 | 499 | 220 | 18 | 205 | 103 |
| (ii) බදු කුලී | 1,112 | 466 | 613 | 144 | 144 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 348 | 1,822 | 118 | 688 | 152 | 536 |
| (iv) වරෙන්තු ගාස්තු හා දඩ | 243 | 182 | 604 | 2,154 | 2,857 | 578 |
| (v) වෙනත් ආදායම් | 662 | 94 | 568 | - | - | - |

### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු1,190,214 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.263,370 ක මුද්දර ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 වරිපනම් බදු හා අක්කර බදු

වරිපනම් හෝ අක්කර බදු ගෙවීම පැහැර හැර ඇති විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(ඇ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර එකී බදු මුදල් අයකරගත යුතු වුවද, ඒ අනුව කටයුතු නොකිරීම නිසා 2010 දෙසැම්බර් 31 දිනට රු.81,432 ක හිඟ බදු පැවතුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාළ විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු | රු. | රු. | රු |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 8,811 | 7,841 | 970 | 8,323 | 6,521 | 1,802 |
| අනෙකුත් | 2,731 | 2,706 | 25 | 1,442 | 3,184 | (1,742) |
| උප එකතුව | 11,542 | 10,547 | 995 | 9,765 | 9,705 | 60 |
| ප්‍රාග්ධන වියදම | 5,425 | 23,273 | (17,848) | 3,333 | 17,178 | (13,845) |
| මුළු එකතුව | 16,967 | 33,820 | (16,853) | 13,098 | 26,883 | (13,785) |
| | ======= | ======= | ====== | ======= | ======= | ==== |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | - |
| ද්විතිය | 13 | 07 |
| ප්‍රාථමික | 15 | 14 |
| වෙනත්(අනියම්/තාවකාලික) | - | 10 |

2.5 වත්කම් කළමනාකරණය

2:5:1 නිෂ්ක්‍රිය භෞතික සම්පත්

(අ) සභාව සතු විදුලි උත්පාදක යන්ත්‍රය අළුත් වැඩියා කිරිම සඳහා 2009 මාර්තු 22 දින රු.41,695 ක වියදමක් දරා තිබුණත් පරීක්ෂණ දිනය වූ 2011 අගෝස්තු 03 දින වන විටත් එය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අක්‍රීය තත්ත්වයේ පැවතුණි.ඒ අනුව ඊට අදාළව දරන ලද වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ආ) සභාවේ අරමුදල් යොදාගෙන ස්ථාපිත කර තිබූ බිලොක්ගල් නිෂ්පාදන ව්‍යාපෘතිය පරීක්ෂණ දිනය වූ 2011 අගෝස්තු 03 දින වන විටත් අක්‍රියව පැවති බැවින් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි.

2.5.2 අයවිමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂ වල එකතුව රු.2,135,645 ක් විය.

2.5.3 සමීක්ෂණය නොකළ වත්කම්

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම් වල වටිනාකම රු.9,373,765 ක් විය.

2.6 මෙහෙයුම් ආකර්යක්ෂමතා

(අ) <u>විථි පහන් නඩත්තු කිරිම</u>

විදුලි කාර්මිකයෙකුගේ සහාය ඇතිව සභාව මගින් ප්‍රදේශයේ විථිපහන් නඩත්තු කටයුතු කරනු ලබන අතර ඒ සඳහා 2010 වර්ෂයේ රු.53,929 ක් වියදම් දරා තිබුණ අතර ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී නොතිබිම හේතුකොටගෙන එකී මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) කරදමුල්ල ජලයෝජනා ක්‍රමය
-------------------------------

කරදමුල්ල ජල යෝජනා ක්‍රමය රු.1,200,000 ක වියදමක් දරා ඉදිකර තිබුණද 2011 අගෝස්තු වන විටත් ජනතාව සඳහා ප්‍රතිලාභ අත්පත් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) අයිතිය පවරා නොගැනීම
---------------------------

2010 වසරේදී සභාව මගින් ප්‍රජාශාලා 03 ක් ඉදිකර තිබූ අතර එම ගොඩනැගිලි ඉදිකළ ඉඩම් වල අයිතිය නියමිත පරිදි සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.7 කොන්ත්‍රාත් පාලනය
----------------------

ජාතික සවිය ගම නැගුම -2010 යටතේ ඉලුකකුඹුර ග්‍රාමීය සමෘද්ධි සමිතිය මගින් ඉලුක්කුඹුර ගම මැද පාර කර්මාන්තය රු.415,672 ක වියදමින් වැඩිදියුණු කර තිබුණි.

2011 අගෝස්තු 04 දින කරන ලද භෞතික පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පැති කානු කැපීම සිදුකර නොතිබීම,
(ආ) බොරළු අතුරා නොතිබීම ,
(ඇ) 1:2:4 මිශ්‍රණයට අනුව කොන්ක්‍රීට් අඩුවෙන් යෙදීම ,
(ඈ) ඉටුනොකරන ලද වැඩ විෂයයන් සඳහා රු.91,495 ක් වැඩිපුර ගෙවා තිබීම.

2.8 අභ්‍යන්තර විගණනය
----------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන
------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) ගබඩා පාලනය
(උ) වාහනය පාලනය
(ඌ) ණයගැති හා ණයහිමි පාලනය